# කාර්ය සාධන වාර්තාව

# 2025

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# 2025 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය - 240

පටුන


**1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය ..... 4**

1.1 හැඳින්වීම ..... 4

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ..... 4

1.3 ප්‍රධාන කාර්යයන් ..... 5

1.3.1 **ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම** ..... 5

1.3.2 **පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම** ..... 5

1.3.3 **අත්තිකාරම් ගිණුම් කටයුතු** ..... 6

1.3.4 **අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම** ..... 6

1.3.5 **වෙනත් ක්‍රියාකාරකම්** ..... 7

**1.4 සංවිධාන සටහන** ..... 8

**2 2024 වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 11**

2.2 රාජ්‍ය වියදම් කළමනාකරණය ..... 20

2.2.1 **අයවැය ක්‍රියාත්මක කිරීම 2024** ..... 20

2.2.2 **පරිපූරක ඇස්තමේන්තු** ..... 20

2.2.3 **පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර** ..... 21

2.2.4 **ප්‍රතිපාදන මාරු කිරීම** ..... 22

2.2.5 **පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් අමතර ප්‍රතිපාදන ලබාදීම** ..... 23

2.2.6 **රජයේ වියදම** ..... 23

2.2.7 ආපදා කළමනාකරණ වියදම ..... 25

2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු ..... 26

2.3.1 **උපරිම ලැබීම් සීමාව** ..... 26

2.3.2 **අවම ලැබීම් සීමාව** ..... 24

2.3.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම්වල පොලී ආදායම** ..... 24

2.3.4 **වාණිජ, ගබඩා සහ අනෙකුත් අත්තිකාරම් ගිණුම්වල මූල්‍ය කාර්යසාධනය** ..... 24

2.3.5 **අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය** ..... 25

**3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ..... 27**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... 27

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 28

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... 31

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ..... 33

3.4.1 **වාර්තා කිරීමේ පදනම** ..... 33

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - ..... 33

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය ..... 33
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ..... 33
3.8 විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් වාර්තාව ..... 34
3.9 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති මතය ..... 34
**ඇමුණුම I ලෙස අමුණා ඇති ලේඛණ.....**
**4 කාර්ය සාධන දර්ශක ..... 35**
4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2025 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ ..... 35
**5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..... 36**
**6 මානව සම්පත් පැතිකඩ ..... 38**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ..... 38
6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය ..... 38
6.3 මානව සම්පත් සංවර්ධනය ..... 38
**7 අනුකූලතා වාර්තාව ..... 46**

**වගු ලැයිස්තුව**

**2.2.2 පරිපූරක ඇස්තමේන්තු..... 21**
**2.2.3 පරිපූරක විශේෂ නීති බලපත්‍ර..... 22**
**2.2.6 වියදම් ප්‍රවර්ගය අනුව රාජ්‍ය වියදම..... 24**
**2.2.7 ආපදාව සිදු වූ දින සිට 2025.12.31 දක්වා වෙන් කරන ලද ප්‍රතිපාදන..... 25**

## 1.1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තු පනත්වල ප්‍රතිපාදන යටතේ වන නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති රාමුව තුල සමස්ථ මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරයි. මෙම ක්‍රියාවලියේ දී රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ මහා භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග නිරන්තර අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වෙන් කිරීම් හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය

### මෙහෙවර

පොදු භාණ්ඩ (Public goods) සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදාහැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීමෙන් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම.

### අරමුණු

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- මූල්‍ය කම්පන වලට ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

# 1.3 ප්‍රධාන කාර්යයන්

## 1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව (MTFF) හා අදාල වර්ෂයේ රාජ්‍ය මූල්‍ය අවකාශය (Fiscal Space) හඳුනා ගැනීම හා අයවැය සම්පාදනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම
- වියදම් ඒකක සමඟ සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමඟ අයවැය සාකච්ඡා/උපදේශක රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ද විමසා වියදම, මූල්‍යකරණ (දේශීය හා විදේශීය) හා ණය ගැනීම් සීමාවන් පිළිබඳව අවසාන තීරණවලට එළඹීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම සඳහා)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අවස්ථාවේ පාර්ලිමේන්තුවට සහභාගී වීම හා අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින් ද එම අවස්ථාවට සහභාගීවන බවට සහතික වීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමේ අවස්ථාවේ පාර්ලිමේන්තුවට සහභාගී වීම
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

## 1.3.2 ප්‍රවර්තන වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුළත්ව අදාල උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.

- අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ ප්‍රකාශිත අරමුණු වෙනුවෙන්ම එම ප්‍රතිපාදන යොදාගැනෙන බව සහ රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා පාලන විධික්‍රම බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වැය දරන ආයතන සමඟ එක්ව කටයුතු කිරීම.
- ප්‍රතිපාදන වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය අරමුණු කොට ගෙන ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන නැවත වෙන් කිරීම (reallocation) / මාරු කිරීම (Transfer).
- වාර්ෂික අයවැය සංචිතය කළමනාකරණය කිරීම.

### 1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වැය දරන ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම්වල සීමා සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

### 1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

- අයවැය යෝජනා විශ්ලේෂණය කර වඩාත් සුදුසු ආයතන වෙත අදාල ප්‍රතිපාදන නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම
- අවශ්‍ය පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම
- විශේෂ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (වාහන ලීසිං / ජුලි වැඩ වර්ජක දීමනා / යතුරු පැදි ලබා දීම වැනි)

### 1.3.5 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විෂයපථයට අයත් රාජ්‍ය ආයතන අධීක්ෂණයට අදාළ ක්‍රියාකාරකම්

- රාජ්‍ය ව්‍යවසායන් සහ ව්‍යවස්ථාපිත ආයතන 124ක් වෙත ප්‍රතිපාදන වෙන්කිරීම සහ ඒවායේ අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම
- 2003.10.28 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 17 ප්‍රකාරව එම රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ විදේශ සංචාර සඳහා වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම
- අයවැය ප්‍රතිපාදනවලින් මාසික අක්මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබාදීම
- එම රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම සහ සේවක සංඛ්‍යාවේ ඇතුළත් තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නිතිපතා කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ ඒවායේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීම.

### 1.3.6 වෙනත් කටයුතු

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවක් වන රාජ්‍ය මුදල් කාරක සභාවේ (Committee on Public Finance - COPF) රැස්වීම් සඳහා කැඳවූ අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන්වන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (Committee on Public Accounts - COPA) සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා (Committee on Public Enterprises - COPE) රැස්වීම් සඳහා කැඳවූ අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- වෙනත් පාර්ලිමේන්තු කාරක සභාවල දී සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවන රැස්වීම්වල දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම

- දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණ කෙටුම්පත් කිරීම

## 1.4 සංවිධාන සටහන




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ.ජ. | - | අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - | ගණකාධිකාරී |
| අ | - | අධ්‍යක්ෂ | නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - | පරිපාලන නිලධාරී |
| ස.අ. | - | සහකාර අධ්‍යක්ෂ | ක.සේ.නි. | - | කළමනාකරණ සේවා නිලධාරී | භා.ප. | - | භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - | තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - | සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - | කාර්යාල කාර්යය සහයක |

## 2 2024 වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වෙනත් වර්ෂවලදී මෙන්ම 2024 වර්ෂය තුළ දී ද 2025 වර්ෂය සඳහා වන අයවැය සම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, 2024 අගෝස්තු 12 වැනි දින අංක 02/2024 දරන අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කර එවකට පැවති අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා ද පවත්වන ලදී . එසේ වුවත්, 2024 සැප්තැම්බර් මස 24 දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් හා අමාත්‍ය මණ්ඩල ව්‍යුහය තාවකාලිකව වෙනස් වීම හේතුවෙන් 2025 අයවැය සාකච්ඡා කටයුතු ද තාවකාලිකව අත්හිටුවන ලදී. 2024 නොවැම්බර් 21 දින අභිනව පාර්ලිමේන්තුව රැස් වූ නමුත් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාළව ව්‍යවස්ථානුකූලව නියමව ඇති පියවරයන් අනුගමනය කරමින් 2024 වර්ෂයේ ඉතිරි කාලය තුළ 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව සම්මත කර ගැනීමට හැකියාවක් නොතිබුණි.

එබැවින් 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23 (1) වගන්තිය ප්‍රකාරව 2025 වර්ෂයේ මුල් මාස 4 ක කාලයක් තුළ රජයේ වියදම් දැරීමට හැකි වන පරිදි අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම අතුරු සම්මත ගිණුම 2024.12.06 දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදී.

එම ක්‍රියාවලිය අතරතුර නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සහ 2024.11.25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කරන ලද නව අමාත්‍යාංශ ව්‍යුහයන් අනුව, අංක 02/2024 දරන අයවැය කැඳවීමේ චක්‍රලේඛය ප්‍රකාරව නව අමාත්‍යාංශ සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව 2025 වර්ෂය සඳහා සකස් කර තිබූ තාවකාලික අයවැය ඇස්තමේන්තු සමාලෝචනය, සංශෝධනය හා ගැලපීම සඳහා කටයුතු කරනු ලැබී ය.

ඉන් අනතුරුව, වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රමවේදය යටතේ නියමිත කාර්යපටිපාටිමය ක්‍රියාමාර්ග අනුව, 2025 අංක 03 දරන විසර්ජන පනත 22.03.2025 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. ඒ අනුව, 2025 වර්ෂය තුළ වියදම් දැරීමට අදාළව වැය දරන ආයතන වෙත උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කරමින් අංක 01/2025 දරන බලය පැවරීමේ චක්‍රලේඛය 2025.03.22 දින නිකුත් කරන ලදී.

තවද, 2026 වර්ෂය සඳහා අයවැය සකස් කිරීම ද 2025 වර්ෂයේදී සිදු කරනු ලැබීය. අලුතින් පිහිටුවන ලද අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු ඇතුළත් කරමින් විසර්ජන පනත් කෙටුම්පත 2025.09.17 වැනි දින ගැසට් කරන ලද අතර 2025.09.26 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබී ය. 2026 අයවැයට අදාළ 2025 අංක 23 දරන විසර්ජන පනත 2025.12.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබී ය. තවද, 2026 වර්ෂය තුළ වියදම් සිදු කිරීම සඳහා බලය පවරමින් අංක 09/2025 දරන ජාතික අයවැය චක්‍රලේඛය 2025.12.19 වැනි දින නිකුත් කරනු ලැබී ය.

එමෙන්ම, දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වයට ප්‍රතිචාර වශයෙන්, ආපදාවෙන් පීඩාවට පත් ජනතාවගේ අඩාල වූ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. බිලියන 50ක අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීම අරමුණු කරමින්, 2025 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු අංක 06 සකස් කරන ලදී.

මේ අතර, දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ඇති වූ හදිසි ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් පුද්ගලයින්ගේ ජීවනෝපාය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස 2026 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු අංක 01 ද 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සකස් කරනු ලැබීය.

### පුරවැසි අයවැය

අයවැය විනිවිදභාවයේ වැදගත්කම හඳුනාගනිමින්, රජයේ අයවැය පිළිබඳ තොරතුරු මහජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි පරිදි සරල, පාරිභාෂිකභාවයෙන් අඩු මෙන්ම වඩාත් මහජන හිතකාමී ආකෘතියකින් ලබා දීමේ අරමුණෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ සිට වාර්ෂිකව පුරවැසි අයවැය සකස් කරන ලදී. 2024 වර්ෂයේ අයවැය දෙවන වර කියවීමේදී, ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව වෙත මෙම ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී. වර්තමානයේ දී, 2024 අගෝස්තු 8 වන දින සම්මත කරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින්, වාර්ෂික අයවැයේ මහජන හිතකාමී අනුවාදයක් සකස් කර වාර්ෂික අයවැයට සමගාමීව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අනිවාර්ය කර ඇත.









## 2.1 විස්තරාත්මක කාර්ය සාධනය

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2025 අංක 03 දරන විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය | වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2025 අංක 03 දරන විසර්ජන පනත යටතේ 2025 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා වූ 2025.03.22 දිනැති අංක 01/2025 දරන ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව මු.රෙ. 66 සහ මු.රෙ. 69 (වීරමොං ක්‍රියාපටිපාටිය) යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සඳහා බලය ලබාදීම.<br><br>වීරමොං ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරන ලද මාරු කිරීම් පිළිබඳ කාලානුරූප වාර්තා2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 24 (4) වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම<br><br>රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ දක්වා ඇති විධිවිධාන පිළිපැදීම | ප්‍රතිපාදන මාරුකිරීම සඳහා වූ ඉල්ලීම් 1,864 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 1,853 ක් සඳහා මු.රෙ. 66 යටතේ ද, ඉල්ලීම් 11 ක් සඳහා මු.රෙ. 69 යටතේ ද බලය ලබා දෙන ලදී.<br><br>සැප්තැම්බර් මාසය අග දක්වා එලෙස සිදු කරන ලද මාරු කිරීම්වලට අදාළ වාර්තා 2ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. |
| | විසර්ජන පනතේ 6 (1) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම. | වැය දරන ආයතනවල මනා ක්‍රියාකාරීත්වය සහතික කිරීම පිණිස අතිරේක ප්‍රතිපාදන සලසා දීම. | අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදා: වසංගත සහ ස්වාභාවික ආපදා) අවශ්‍යතා සපුරාලීම පිණිස වර්ෂය තුළ දී පරිපූරක ප්‍රතිපාදන සඳහා වූ ඉල්ලීම් සඳහා පරිපූරක ප්‍රතිපාදන ලිපි 350ක් මඟින් රු. බිලියන 136 ක ප්‍රතිපාදන වැය දරන ආයතන වෙත නැවත විසර්ජනය කරන ලදී.<br><br>ඉහත සඳහන් කර ඇති අතිරේක ප්‍රතිපාදන ලෙස වෙන්කර ඇති රු. බිලියන 136 කින් රු. බිලියන 30 ක්, **දිට්වා සුළි සුළඟ** හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වයෙන් අනතුරුව සිදු කළ සහන කටයුතු සඳහා පහසුකම් |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | | | සැලසීමේ අරමුණින්, වැය ශීර්ෂ අංක 240 – ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ ඇති සංවර්ධන ක්‍රියාකාරකම් වැඩසටහනට යටතේ ඇති කරන ලද **"ආපදා සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය"** යටතේ නිකුත් කරන ලද අතිරේක ප්‍රතිපාදන ලිපි 15ක් මඟින් ලබා දී ඇත. |
| | පරිපූරක ප්‍රතිපාදන ලබාදීම පිළිබඳව මාස දෙකකට වරක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම | ලබා දුන් සියලුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 09 ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. |
| 2. 2026 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියලුම වැය දරන ආයතන විසින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම. | 202 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් වූ අංක 02/2025 දරන චක්‍රලේඛය 2025.06.30 දින නිකුත් කරන ලදී. |
| | මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර රාජ්‍ය මූල්‍ය රාමුව තීරණය කිරීම. | නෛතික රාමුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරාමිතීන් තුළ රජයේ ආර්ථික සංවර්ධන අරමුණුවලට අදාළ වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් ගිවිසුම පදනම් කරගනිමින් සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව රාජ්‍ය මූල්‍ය රාමුව සකස් කොට අවසන් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | අදාළ අමාත්‍යාංශය සහ වැය දරණ ආයතන සමඟ ඇයවැය සාකච්ඡා පැවැත්වීම | වැය දරන ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් සලකා බලා, පවත්නා රාජ්‍ය මූල්‍ය අවකාශයට ගැලපෙන පරිදි වියදම් ප්‍රමුඛතාගත කරමින්, නිසි මූල්‍ය කළමනාකරණයක් හා මූල්‍ය විනයක් සහිතව අදාළ රාජ්‍ය මූල්‍ය ඉලක්කවලට අනුකූල වන පරිදි අයවැයක් සකස් කිරීම. | 2025.08.05 දින සිට 2025.09.04 දින දක්වා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් භාණ්ඩාගාර ලේකම් / නියෝජ්‍ය ලේකම්වරුන් විසින් ප්‍රධානත්වය දරන / සම සභාපතිත්වය දරන ලද සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |
| | 2026 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | විසර්ජන පනත් කෙටුම්පතට අදාළ ගැසට් නිවේදනය පළ කිරීම හා කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.<br><br>විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු, වාර්ෂික අයවැයේ මහජන හිතකාමී අනුවාදය සහ අනෙකුත් ලේඛනවල කෙටුම්පත් මුද්‍රණය කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.<br><br>විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමත කිරීම. | 2026 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2025.09.17 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර 2025.09.26 දින පාර්ලිමේන්තුවේ (පළමුවර කියවීම) සභාගත කරන ලදී.<br><br>අයවැය දෙවන වර කියවීමේදී, විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු, වාර්ෂික අයවැයේ මහජන හිතකාමී අනුවාදය සහ අනෙකුත් ලේඛනවල කෙටුම්පත් මුද්‍රණය කර නියමිත දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>අයවැය කතාව (අයවැය දෙවන වර කියවීම) 2025.11.07 දින පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලදී<br><br>දෙවනවර කියවීමේ විවාදය 2025.11.08 සිට 2025.11.15 දක්වා පැවැත්විණි.<br><br>කාරක සභා අවස්ථාවේ විවාදය 2025.11.17 සිට 2025.12.05 දක්වා පැවැත්විණි.<br><br>විසර්ජන පනත් කෙටුම්පත 2025.12.05 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.<br><br>2025.12.05 දින අංක 23/2025 දරන විසර්ජන පනත ගරු කථානායකතුමා විසින් අත්සන් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රය නිකුත් කිරීම. | වියදම් සඳහා බලය ලබාදීම. | 2025.12.10 දින ගරු මුදල් අමාත්‍යතුමා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී. |
| | වියදම් කළමනාකරණය සඳහා උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම. | වියදම් හා කළමනාකරණය සඳහා බලය ලබාදීම. | “2025 අංක 23 දරන විසර්ජන පනත යටතේ 2026 වර්ෂය තුළ වියදම් දැරීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා බලය ලබා දීම” පිළිබඳ ජාතික අයවැය චක්‍රලේඛ අංක 09/2025, 2025.12.19 දින නිකුත් කරන ලදී. |
| 3. අත්තිකාරම් ගිණුම් කටයුතු | 2024 වර්ෂය තුල සීමා සංශෝධනය කරන ලද අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම | විසර්ජන පනතේ 8 වන වගන්තියට අනුකූලව අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳව වූ සීමා සංශෝධනයන් බලාත්මක කිරීම | අත්තිකාරම් “බී” ගිණුම් 19 ක් සහ වාණිජ අත්තිකාරම් අත්තිකාරම් ගිණුම් 9ක් 2024 වර්ෂයට අදාලව සීමා සශෝධනයන් සඳහා 2025 වර්ෂය තුළ දී යෝජනා 10 ක් යටතේ නියමයන් 28 ක් මගින් පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන ඇත. |
| | 2025 වර්ෂය සඳහා වන අත්තිකාරම් ගිණුම් කටයුතු මෙහෙයවීම | අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වා ගැනීම<br><br>රජයේ නිලධාරීන්ට අවම පොලියක් යටතේ ණය හා අත්තිකාරම් ලබා ගැනීමට පහසුකම් සැලසීම.<br><br>ගබඩා හා වෙනත් අත්තිකාරම් ගිණුම් අලාභයකින් තොරව පවත්වාගෙන යාම<br><br>වාණිජ අත්තිකාරම් ගිණුම් ලාභදායීව පවත්වාගෙන යාම | 2025 අංක 03 දරන විසර්ජන පනතෙහි III වන උපලේඛණය<br><br>සමාලෝචිත වර්ෂය තුල දී රු. මිලියන 20,676 ක ණය/අත්තිකාරම් ලබා දී ඇත.<br><br>සමාලෝචිත වර්ෂය තුල දී රු. මිලියන 1,700 ක පොලී ආදායමක් උපයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් අලාභයකින් තොරව පවත්වාගෙන ගොස් ඇත.<br><br>අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් 05 කින් ආසන්න වශයෙන් රු. මිලියන 2,628 ක ලාභයක් උපයා තිබුණි. |
| | අවශ්‍යතාවය මත අත්තිකාරම් ගිණුම් සඳහා නියම කරන ලද සීමාවන් සංශෝධනය කිරීම | සීමා සංශෝධනය සඳහා ඊළඟ වර්ෂයේ මැයි 31 වැනි දිනට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම | සමාලෝචිත වර්ෂය තුල දී රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේ ගිණුම් 36 සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා වන වාණිජ අත්තිකාරම් ගිණුම් 08 ක සීමා සංශෝධන සිදුකර ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2026 වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් සීමාවන් නිර්ණය කිරීම | අත්තිකාරම් ගිණුම් පවත්වා ගැනීම | 2026 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල III වැනි උපලේඛනය |
| 4. පාර්ලිමේන්තු කාරක සභා සඳහා සහාය දැක්වීම | රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාවේදී දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම | පාර්ලිමේන්තු කාරක සභා සඳහා කැඳවීම් ලද විට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවශ්‍ය සහභාගීත්වය ලබා දීම | කාරක සභා රැස්වීම් සඳහා කැඳවීම් සිදු කරන ලද සෑම කාරක සභා රැස්වීමක් සඳහා ම නිලධාරියෙකු/ නිලධාරීන් සහභාගී වී ඇත. |
| 5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>(අ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) මූල්‍ය ප්‍රකාශන<br><br>(ඇ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය වියදම් සමාලෝචනය පරිච්ඡේදය | නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම. | පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.<br><br>(අ) කාර්ය සාධන වාර්තාව<br><br>(ආ) මූල්‍ය ප්‍රකාශන 2024<br><br>(ඇ) වියදම් සමාලෝචනය 2024 |
| | ධාරිතා ගොඩනැංවීම | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය. | විදේශීය ආයතන විසින් දායකත්වය සපයන ලද විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 24 දෙනෙකු සහභාගී වී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අදාල වන පරිදි නිලධාරීන්ට දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම | අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවෙකුටම ණය අත්තිකාරම් ප්‍රදානය කිරීම | බලය ලබා දී ඇති සීමාවන් පිළිපදිමින් රු. 10,999,413.50ක් වටිනා ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් ලබා දී ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම. | විගණන විමසුම් අවම කිරීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් එවන ලද සියලුම විගණන විමසුම් (විගණන විමසුම් 07ක්) සඳහා පිළිතුරු ලබාදෙන ලදී. |
| 6. විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැළසීම. | අවශ්‍ය අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවලට සහභාගී වීම. | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම. | අදාල අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා භෞතිකව හෝ මාර්ගගතව සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.<br><br>එමෙන්ම, දෙපාර්මේන්තුව විමසා සිටි අවස්ථාවල දී 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අදාළ කෙටුම්පත් රෙගුලාසි සහ නියෝග සඳහා අදහස්, නිරීක්ෂණ සහ යෙදවුම් ලබා දීම සඳහා කාලෝචිත පියවර ගනු ලැබීය.<br><br>තව ද, සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙනු ලබන අදහස්, නිරීක්ෂණ, යෙදවුම් සහ ප්‍රදායකයින් හා පවත්වනු ලබන සහසබඳතා කාලානුරූපීයව සිදු වන බවට සහතික විය.<br><br>භාණ්ඩාගාරය වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලැස්ම (2026-2029) සකස් කිරීමේ සමස්ත සම්බන්ධීකරණ කාර්යය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් කමිටු රැස්වීම්, දෙපාර්තමේන්තු සමඟ අනෙකුත් රැස්වීම් මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණ සහාය දූත මණ්ඩල සමඟ රැස්වීම් කැඳවීමෙන් සිදු කරන ලදී. |

**2025 ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය**

**ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සහ ජීවනෝපාය සවිබල ගැන්වීම**

2025 අගභාගයේදී **දිට්වා සුළි කුණාටුව** හේතුවෙන් ඇති වූ පෙර නොවූ විරූ ව්‍යසනයට ප්‍රතිචාර වශයෙන්, හදිසි ප්‍රතිචාර යාන්ත්‍රණය සහ යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය සඳහා සම්පත් නැවත වෙන් කිරීම තුළින් සහන සැලසීමේ කටයුතුවල දී මූල්‍ය එන්ජිම ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව පෙරමුණ ගෙන ක්‍රියාත්මක විය.

මානුෂීය ආධාර බාධාවකින් තොරව ගලා යාම සහ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම පිළිබඳව සහතික වනු පිණිස අරමුදල් බෙදී යාම විධිමත් කිරීම තුළින් ආපදාවෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවිත කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම අප දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ විය.

දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හට අවශ්‍ය පුද්ගලයන් වෙත හදිසි සහන ආධාර සහ ප්‍රතිසාධන සහනාධාර ලබා දීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කිරීමට හැකි වන පරිදි, ආධාර බෙදා හැරීම විමධ්‍යගත කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කඩිනම් ප්‍රතිචාර අයවැය චක්‍රලේඛ නිකුත් කරන ලදී. තවද, ආපදාවෙන් පීඩාවට පත් ජනතාව සවිබලගැන්වීම සඳහා රජයේ සහන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය චක්‍රලේඛ ද නිකුත් කරන ලදී.

"ආපදාවෙන් පීඩාවට පත් වූ ජනතාව සවිබලගැන්වීමේ වැඩසටහන" සඳහා නීතිමය සහ මූල්‍යමය රාමුව පහත චක්‍රලේඛ මගින් සැකසිණි.

| චක්‍රලේඛ අංකය | විස්තරය | දිනය |
|---|---|---|
| **05/2025** | ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට බාධාවකින් තොරව සහන සැලසීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් හට මූල්‍ය බලතල ලබා දීම. | 2025-11-28 |
| **06/2025** | ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී, දෙපාර්තමේන්තු ප්‍රධානී සහ දිස්ත්‍රික් ලේකම් හට මූල්‍ය බලතල ලබා දීම. | 2025-12-01 |
| **07/2025** | ආපදාවෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවිත කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා පළාත් සභා වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ලබා දීම. | 2025-12-02 |
| **08/2025** | ආපදාවෙන් පීඩාවට පත් ජනතාව සවිබලගැන්වීමේ වැඩසටහන (පූර්ණ සහන ඇතුළත් උපලේඛණය). | 2025-12-05 |
| **08/2025 (i)** | ආපදාවෙන් පීඩාවට පත් වූවන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ බෝග හානි, පශු සම්පත් ගොවීන් සහ ධීවරයින් සඳහා දීමනා ලබා දීම පිළිබඳ නව උප වර්ගීකරණයන් ඇතුළත් කිරීම. | 2025-12-20 |
| **08/2025 (ii)** | ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සහ පීඩාවට පත් ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීම සඳහා 2026 වසර සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීමේ යාන්ත්‍රණය. | 2026-01-08 |

## 2.2 රාජ්‍ය වියදම් කළමනාකරණය

### 2.2.1 2025 අයවැය ක්‍රියාත්මක කිරීම

2025 වර්ෂය සඳහා වන 2025 අංක 03 දරන විසර්ජන පනත 2025.03.21 දිනැතිව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. එම විසර්ජන පනත අනුව රජයේ සමස්ත පුනරාවර්තන වියදම රු. බිලියන **5,920** ක් වූ අතර, ප්‍රාග්ධන වියදම හා ණය ආපසු ගෙවීම් පිලිවෙළින් රු. බිලියන **1,315** ක් සහ රු. බිලියන **1,600** ක් විය.

පාර්ලිමේන්තුව විසින් යම් නිශ්චිත වර්ෂයක් සඳහා සම්මත කරනු ලබන සමස්ත වියදම පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන්, මුදල් අමාත්‍යවරයා විසින් පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීමෙන්, සංශෝධිත විසර්ජන පනත් කෙටුම්පතක් ඉදිරිපත්කිරීමෙන් හෝ විසර්ජන පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව ප්‍රතිපාදන ඉවත් කර ගැනීමෙන් සංශෝධනය කළ හැක.

එලෙසින්, 2025 සඳහා වූ මූල්‍ය වර්ෂය තුළ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තු 06 ක්, මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර 05 ක්, වාර්ෂික අයවැය සංචිතයෙන් ලබා දෙන ලද පරිපූරක ප්‍රතිපාදන වෙන් කිරීමේ 350ක් හා ඊට අමතරව, වීරමෝං ක්‍රියාපටිපාටිය යටතේ වූ ප්‍රතිපාදන මාරු කිරීම් 1,864 ක් අනුමත කිරීම හේතුවෙන් සම්මත අයවැයෙහි සංයුතිය පහත පරිදි සංශෝධනය විය.

- පුනරාවර්තන වියදම - රු. බිලියන **5,921.6**
- ප්‍රාග්ධන වියදම - රු. බිලියන **1,337.5**
- ණය ආපසු ගෙවීම් - රු. බිලියන **1,618.5**

ඒ අනුව, 2025 අංක 03 දරන විසර්ජන පනතේ සඳහන් සමස්ත වියදම වූ, රු බිලියන 8,835 වසර අවසාන වන විට රු. බිලියන 8,877.7 ක් දක්වා සංශෝධනය විය.

### 2.2.2 පරිපූරක ඇස්තමේන්තු

2025 වර්ෂයේදී, පාර්ලිමේන්තුව විසින් අවස්ථා 03 කදී (2025.09.11, 2025.10.08 සහ 2025.12.05 යන දිනවල) පරිපූරක ඇස්තමේන්තු 06 ක් අනුමත කර ඇති අතර, එහි මුළු වටිනාකම රු. බිලියන 151.4 කි.

මේ අනුව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රාථමික වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් 13% නොඉක්මවන අනුපාතයකින් රඳවා ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, 2025 අංක 03 දරන විසර්ජන පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු හරහා ප්‍රතිපාදන සිදු කිරීමේදී එයට සමගාමීව ද සමාන ප්‍රතිපාදනයන් අවුරා තැබූ බැවින්, සමස්ත වියදම් ඇස්තමේන්තුවේ වෙනසක් සිදු නොවුනි.

2.2.2 වගුව පරිපූරක ඇස්තමේන්තු

| පරිපූරක ඇස්තමේන්තු අංකය | වැය ශීර්ෂ අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අරමුණ | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01-2025 | 123 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය සඳහා වන චීන එක්සිම් බැංකුව විසින් නොගෙවන ලද බිල්පත් පියවීමට සහ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා දේශීය අරමුදල් සම්පාදනය කර ගැනීම පිණිස | 13,285,600,000 |
| 02-2025 | 171 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | සිංහල අවුරුදු සමයේදී අත්‍යවශ්‍ය ආහාර සහන මිලට ලබාදීම සඳහා වන අයවැය යෝජනාවට අදාළ ප්‍රතිපාදන, ගර්භණී මාතාවන්ට පෝෂණීය ආහාර මල්ලක් සැපයීම සඳහා උපයෝජනය කර ගැනීම පිණිස | 1,500,000,000 |
| 03-2025 | 117 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති ණය මුදලින් කොටසක් ආපසු පියවීම උදෙසා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ 2025 වර්ෂය සඳහා පරිපූරක අයවැය ප්‍රතිපාදන සැලසීම පිණිස | 36,609,000,000 |
| 04-2025 | 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සහන පොලී අනුපාතික ලබාදීම වෙනුවෙන් රාජ්‍ය බැංකු වෙත ප්‍රතිපූර්ණය කළ යුතු මුදල් පියවීම පිණිස | 31,500,000,000 |
| 05-2025 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | භාණ්ඩාගාර ඇපකර හා ආරක්ෂණ ලිපි මත රාජ්‍ය බැංකු විසින් රාජ්‍ය ආයතන වෙත නිකුත් කරන ලද ණයවලින් කල් ඉකුත් වූ ණය සහ 2026-12-31 දිනෙන් කල් ඉකුත්වන ණය ගෙවීම පිණිස | 18,500,000,000 |
| 06-2025 | 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බිඳවැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස | 20,000,000,000<br>30,000,000,000 |
| | | | **එකතුව** | **151,394,600,000** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## 2.2.3 පරිපූරක විශේෂ නීති සේවා අධිකාරි බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛණයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබා ගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා අධිකාරි බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත.

ඒ අනුව, පහත වගුවේ දක්වා ඇති කාර්යයන් සඳහා අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2025 වර්ෂයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රු. බිලියන 43 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා අධිකාරි බලපත්‍ර 05 ක් නිකුත් කර ඇත.

2.2.3 වගුව පරිපූරක විශේෂ නීති සේවා අධිකාරි බලපත්‍ර

| අංකය | වැය ශීර්ෂය | ආයතනය | කාර්යය/අරමුණ | මුදල (රු) |
|---|---|---|---|---|
| 02 | 016 | පාර්ලිමේන්තුව | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක **04/2025** ප්‍රකාරව වැඩි වූ වැටුප සැලකිල්ලට ගනිමින්, පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ වැටුප් ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම. | 430,000 |
| 03 | 004 | උපරිමාධිකරණ විනිසුරුවරුන් | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක **02/2025** අනුව වැඩි වූ වැටුප සැලකිල්ලට ගනිමින්, උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ වැටුප් ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම. | 4,500,000 |
| 04 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **15/2025** සහ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක **01/2025** අනුව "වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ අනත්දරු, රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප්" ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම. | 3,000,000,000 |
| 05 | 007 | අධිකරණ සේවා කොමිෂන් සභාව | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක **02/2025** අනුව වැඩි වූ වැටුප සැලකිල්ලට ගනිමින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් සඳහා දීමනා ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම. | 400,000 |
| 06 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | දේශීය ණය සඳහා පොලී ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීම. | 39,700,000,000 |
| | | | | 42,705,330,000 |

## 2.2.4 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුළ මුදල් රෙගුලාසිවල සඳහන් "වීරමොං පටිපාටිය"(Virement Procedure) යටතේ, උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට විසර්ජන පනතේ 5 වන වගන්තිය මඟින් වැය දරණ ආයතනයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව, 2025 වර්ෂය තුළ දී රු. බිලියන 336 ක වටිනාකමකින් යුතු එවැනි මාරු කිරීම් 1,864 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

## 2.2.5 සංවර්ධන ක්‍රියාකාරකම් වැඩසටහන මගින් අතිරේක ප්‍රතිපාදන ලබාදීම

වැය දරන ආයතනයන් හි පුරෝකථනය කළ නොහැකි හදිසි හා අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා මෙන්ම දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වයේ පශ්චාත් සහන කටයුතු සැලසීම සඳහා 2025 දී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ "වාර්ෂික අයවැය සංචිත ව්‍යාපෘතිය" සහ "ආපදා සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය" හරහා අතිරේක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

ඒ අනුව, 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් උක්ත කාර්යයන්ට අදාළව විවිධ වියදම් ඒකක සඳහා රු. බිලියන 136 ක පරිපූරක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

2025 අංක 3 දරන විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන සම්බන්ධව වාර්තා වරින්වර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2025 වර්ෂයට අදාළව මෙවැනි වාර්තා 09 ක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ඊට අමතරව ලබා දී ඇති එවැනි අතිරේක ප්‍රතිපාදන ලබාදීම් පිළිබඳ තොරතුරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ ද ඉදිරිපත් කරන ලදී.

## 2.2.6 රජයේ වියදම

ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව 2025 වර්ෂය තුළ සමස්ත රජයේ වියදම රු. බිලියන 7,698ක් ලෙස වාර්තා වී ඇති අතර 2024 රු. බිලියන 10,806ක් වූ අගය හා සැසඳීමේ දී සියයට 28.7ක් එනම් නාමික අගය සැලකූ විට රු බිලියන 3,108ක අඩුවීමකි.

රු.බිලියන 7,698ක් ලෙස වාර්තා වූ රජයේ මුළු වියදමින් සියයට 68.37ක් එනම් රු. බිලියන 5,263ක් පුනරාවර්තන වියදම් වේ. එය 2024 වර්ෂයේ දී මුළු පුනරාවර්තන වියදම වූ රු. බිලියන 5,370 හා සැසඳීමේ දී 2025 වර්ෂය තුළ සියයට 1.9 ක අඩුවීමකි. 2025 වර්ෂයේ මූලධන වියදම රු. බිලියන 1,015.8ක් වූ අතර එය 2024 වර්ෂයේ මූලධන වියදම වූ රු. බිලියන 817.09 හා සැසඳීමේ දී සියයට 24.3 ක වැඩි වීමකි.

එබැවින්, 2024 වර්ෂයේ දී සියයට 53.5 ක් ව පැවති රජයේ මූලධන වියදම්වල උපයෝජන අනුපාතය 2025 දී කැපී පෙනෙන වර්ධනයකින් යුතුව සියයට 76ක සැලකිය යුතු උපයෝජන අනුපාතයක් වාර්තා කර ඇත.

2025 වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් සඳහා වියදම රු. බිලියන 1,419 ක් වන අතර එය 2024 වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් සඳහා වියදම වූ රු. බිලියන 4,618 හා සැසඳීමේ දී සියයට 62.2 ක අඩු වීමකි.

2.2.6 වගුව : **2025 වර්ෂයේ වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

| | රු. බිලියන | පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | **5,263.01** | **100** | **68.37** |
| මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි | 786.33 | 14.94 | 10.21 |
| ගමන් වියදම් | 6.74 | 0.13 | 0.09 |
| සැපයුම් | 340.43 | 6.47 | 4.42 |
| නඩත්තු වියදම | 14.21 | 0.27 | 0.18 |
| සේවාවන් | 103.18 | 1.96 | 1.34 |
| මාරුකිරීම් (පළාත් සභා සහ රාජ්‍ය ආයතන වෙත මාරුකිරීම් ද ඇතුළත්ව) | 1,510.74 | 28.70 | 19.63 |
| පොළී ගෙවීම් සහ වට්ටම් | 2,500.67 | 47.51 | 32.48 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 0.70 | 0.01 | 0.01 |
| | රුපියල් බිලියන | මූලධන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
| **මුළු මූලධන වියදම** | **1,015.82** | **100** | **13.20** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 84.64 | 8.33 | 1.10 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 375.13 | 36.93 | 4.87 |
| මූලධන මාරු කිරීම් | 148.98 | 14.67 | 1.94 |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 142.01 | 13.98 | 1.84 |
| හැකියා ප්‍රවර්ධනය | 4.97 | 0.49 | 0.06 |
| වෙනත් මූලධන වියදම් | 260.10 | 25.60 | 3.38 |
| **රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම** | **1,419.12** | | **18.43** |
| **සමස්ත වියදම** | **7,697.95** | | **100** |

### 2.2.7 ආපදා කළමනාකරණ වියදම්

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, පැන නැඟී ඇති ප්‍රමුඛතා සපුරාලීම සඳහා ප්‍රාග්ධන වියදම් නැවත වෙන් කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කඩිනම් පියවර ගන්නා ලදී. විවිධ වියදම් ශීර්ෂයන් හරහා උපයෝජනය නොවූ ප්‍රතිපාදන හඳුනා ගැනීමෙන්, ප්‍රාථමික වියදම් සීමාවට කිසිදු බලපෑමක් නොවන පරිදි 2025 දී රු. බිලියන 50 කට අධික ප්‍රතිපාදන ප්‍රමාණයක් නැවත වෙන් කිරීමෙහි ලා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමත් විය.

2.2.7 වගුව: ආපදාව සිදු වූ දින සිට 2025-12-31 දක්වා වෙන් කළ ප්‍රතිපාදන

| ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ලබා දී ඇති ප්‍රතිපාදන (රු. මිලියන) |
|---|---|
| **සවිබලගැන්වීමේ වැඩසටහන** | **48,467.9** |
| *ආරක්ෂක අමාත්‍යාංශය* | *34,736.0* |
| *බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය* | *31.9* |
| *කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය* | *1,000.0* |
| *ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව* | *7,500.0* |
| *කෘෂිකර්ම දෙපාර්තමේන්තුව* | *3,000.0* |
| *සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව* | *2,200.0* |
| ආපදාවෙන් බලපෑමට ලක් වූ යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වූ වියදම. | **221.4** |
| *ආරක්ෂක අමාත්‍යාංශය* | *131.4* |
| *උතුරු පළාත් සභාව* | *90.0* |
| ආපදාවෙන් හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා වූ වියදම | **465.7** |
| *උතුරු පළාත් සභාව* | *465.7* |
| **එකතුව** | **49,155.0** |

## 2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

තෝරාගත් රාජ්‍ය බැංකු හරහා ක්‍රියාත්මක කරනු ලබන දේපල ණය හැර රාජ්‍ය නිලධාරීන් වෙත ලබාදෙන ණය හා අත්තිකාරම් සහ රජය විසින් මෙහෙයවන ඇතැම් වාණිජමය ස්වභාවයේ කටයුතු මෙම අත්තිකාරම් ගිණුම යටතට ඇතුලත් වේ. 2025 වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සහ ණය ලබා දීම සඳහා ගිණුම් 167 ක් සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා ගිණුම් 11ක් ඇතුළුව ගිණුම් 178 ක් සඳහා උපරිම වියදම් සීමාවන්, අවම ලැබීම් සීමාවන්, හර ශේෂයේ උපරිම සීමාවන් හා බැරකම පිළිබඳ උපරිම සීමා පාර්ලිමේන්තුව විසින් පනවා ඇත.

### 2.3.1 උපරිම වියදම් සීමාව

ඉහත පරිදි අත්තිකාරම් ගිණුම් 178 සඳහා පනවා ඇති උපරිම වියදම් සීමාව රු. බිලියන 44.218ට සාපේක්ෂව 2025 වර්ෂය සඳහා සත්‍ය වියදම රු. බිලියන 33.39ක් වාර්තා වේ. සමස්ථයක් ලෙස, අපේක්ෂිත උපරිම වියදමින් 77% ක් පමණ සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර ඇත. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීම සඳහා අනුමත ප්‍රතිපාදනවලින් 98%ක් සහ වාණිජ අත්තිකාරම් ගිණුම් සඳහා අනුමත ප්‍රතිපාදන තුලින් 57% ක් පමණ උපයෝජනය කර ඇත. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන විෂය අංක 213 පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය පිළිබඳ අත්තිකාරම් ගිණුමේ වියදම අපේක්ෂිත පරිදි සිදු නොවිය.

### 2.3.2 අවම ලැබීම් සීමාව

2025 වර්ෂයේ රජයේ අත්තිකාරම් ගිණුම මඟින් අපේක්ෂිත අවම ලැබීම් රු. බිලියන 36.218ක් වූ අතර සත්‍ය ලැබීම රු. බිලියන 28.06 පමණ වේ. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සඳහා වන අත්තිකාරම් ගිණුම්වලින් අපේක්ෂිත අවම ලැබීම් ඉලක්කය සපුරා ඇතත්, ඉහත 2.3.1හි වන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විෂය අංක 21302 අවම ලැබීම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සමස්ථ අවම ලැබීම් ඉලක්ක සපුරා ගැනිමට නොහැකි වී ඇත.

### 2.3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම්වල පොලී ආදායම

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සහ ණය ලබාදීම සඳහා 2025 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් 167 ක් පවත්වාගෙන ගොස් ඇති අතර, එම අත්තිකාරම් කටයුතුවලින් පොලී ආදායම ලෙස 2025 වර්ෂය තුල දී රු මිලියන 1,700 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

### 2.3.4 වාණිජ, ගබඩා සහ අනෙකුත් අත්තිකාරම් ගිණුම්වල මූල්‍ය කාර්යසාධනය

වැය ශීර්ෂ 09ක් යටතේ අනෙකුත් අත්තිකාරම් ගිණුම් 11 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් 02 ක් ගබඩා අතිතිකාරම් ගිණුම් ලෙස ද, වෙනත් අත්තිකාරම් ගිණුම් ලෙස ගිණුම් 04 ක් ද ක්‍රියාත්මක වන අතර, ඒවායින් ලාභයක් හෝ අලාභයක් අපේක්ෂා නොකරයි. නිෂ්පාදන හා වාණිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන අත්තිකාරම් ගිණුම් 05 ක් ලාභදායී තත්ත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර, 2025 වර්ෂය සඳහා රු. මිලියන 2,628ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

### 2.3.5 අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය

සමාලෝචිත වර්ෂය තුලදී රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමේ ගිණුම් 36 ක සහ වාණිජමය ස්වභාවයේ කටයුතු සඳහා වන වාණිජ අත්තිකාරම් ගිණුම් 08 ක සීමා සංශෝධන සිදුකර ඇත.

**අයවැය තුළ දේශගුණික විපර්යාසයන් හා සබැඳි වියදම් ගැළපීම සඳහා වන ප්‍රවේශ වැඩසටහන**

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසයන් සම්බන්ධයෙන් වැඩිවෙමින් පවතින අවදානම් සහගත තත්ත්වයකට මුහුණ දෙමින් පවතින අතර, පැරිස් ගිවිසුම සහ ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (NDCs) යටතේ ජාත්‍යන්තර වගකීම් ඉටුකිරීම සඳහා කැප වී සිටීම හේතුවෙන්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති ජාතික දේශගුණ ප්‍රමුඛතා හා ගලපා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. අයවැය තුළ දේශගුණික විපර්යාසයන් හා සබැඳි වියදම් ගැළපීමක් (Climate Budget Tagging - CBT) සිදු කිරීම මඟින් දේශගුණ මූල්‍ය ක්ෂේත්‍රයේ පාරදෘශ්‍යභාවය සහ වගවීම ඉහළ නැංවීමට ඉවහල් වේ. එමඟින්, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා සහාය වීම මෙන්ම විවිධ අංශ අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර දේශගුණ අරමුදල් වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම ද සිදු වේ. ඒ අනුව, අයවැය තුළ දේශගුණික විපර්යාසයන් හා සබැඳි වියදම් ගැළපීමේ වැඩසටහන දියත් කිරීම රාජ්‍ය මූල්‍ය රාමුව තුළ දේශගුණ ප්‍රතිචාරාත්මක අයවැයකරණ ක්‍රමවේද ආයතනගත කිරීමට ගනු ලබන ක්‍රමෝපායික පියවරක් ලෙස සැලකේ.







මෙම අරමුණ සඳහා, ජාතික අයවැය දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා එක්ව අයවැය තුළ දේශගුණික විපර්යාසයන් හා සබැඳි වියදම් ගැළපීම සඳහා වන ප්‍රවේශ වැඩසටහන ආරම්භ කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම සහ අධීක්ෂණය කිරීම පිණිස මාර්ගෝපදේශක කමිටුවක්ද පිහිටුවා ඇත. තවද, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා සහයෝගීතාවයෙන් 2025 දෙසැම්බර් මාසයේදී අයවැය තුළ දේශගුණික විපර්යාසයන් හා සබැඳි වියදම් ගැළපීම පිළිබඳ දෙදින දැනුවත් කිරීමේ වැඩසටහනක් සාර්ථක ලෙස පැවැත්වූ අතර ඒ සඳහා අදාළ ආයතනවල කොටස්කරුවන්ගේ සහභාගීත්වය ලබාගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මෙම වැඩසටහන තුළින් දේශගුණ සංවේදී අයවැයකරණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ රජයේ ජාතික දේශගුණික විපර්යාසයන් සම්බන්ධයෙන් වන බැඳීම් සහ තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා

# 3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

### 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| 2025 අයවැය රු. | | සටහන | තත්‍ය 2025 රු. | 2024 සඳහා නැවත ගලපන ලද රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | (45,080) | 333,509 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **(45,080)** | **333,509** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 630,115,000 | 630,850,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 491,732 | 1,737,986 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,358,020 | 9,949,160 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **642,964,751** | **642,537,145** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **642,919,671** | **642,870,654** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 224,393 | 434,296 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 642,695,278 | 642,436,359 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 123,954,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 145,134,606 | 122,290,861 | |
| 153,669,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 130,967,569 | 147,276,055 | ඒසීඒ-2(ii) |
| 13,200,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 7,409,576 | 13,128,004 | |
| 47,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 47,561 | |
| **290,8871,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **283,511,751** | **282,742,480** | |

| | | | | | |
